ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொடை
Zonal Education Office - Minuwangoda

# 11 ශ්‍රේණිය

# 3 නිපුණතාවය



## විශ්වාසයේ ජීවිතයට ශක්තිය

## දේව ප්‍රසාද නිධාන

සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය


ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 12 පාඩම - ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය |
|---|---|---|

## ප්‍රසාද ස්නාපනය




1. ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමට නම් ප්‍රසාද ස්නාපනය ලැබිය යුතු බව ජේසුස් වහන්සේ විසින් සනාථ කරමින් නිකදේමුස්ට වදාළ වචන ලියන්න
2. ජේසුස් වහන්සේ බව්තීස්ම කිරීමේ බලය අපෝස්තුලුවරුන් වෙත දානය කළේ කුමන අවස්ථාවේදීද?
3. ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන් වෙත බව්තීස්ම කිරීමේ බලය පවරමින් ප්‍රකාශ කළ වචන ලියන්න
4. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද ලියා දක්වන්න
5. "ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් ඔබ ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයක් වූයෙහිය. බරපතල පාපයක් කිරීමෙන් ඒ සා මහත් සම්භාවනීය තැනැත්තෙකු ඔබගේ හෘදයෙන් පළවා නොහරින්න" මෙලෙස ප්‍රකාශ කළේ කවුද?
6. ආත්මික මව්පියෙකු වීමට අවශ්‍ය සුදුසුකම් 7 ක් ලියන්න




7. ප්‍රසාද ස්නාපනයේදී භාවිතා ප්‍රධාන කරන සංකේත 4 නම් කරන්න
8. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන ජලය හා සම්බන්ධ බයිබලීය කරුණු 2 ක් ලියන්න
9. ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්ය සංකේතය කුමක්ද?
10. සුදු වස්ත්‍රය දරුවා මත තැබීමෙන් සංකේතවත් වන්නේ කුමක්ද?
11. සුදු වස්ත්‍රය හා ක්‍රිස්තුන් වහන්සේ සම්බන්ධ බයිබලයේ දැක්වෙන කරුණු 2 ක් ලියන්න
12. "ක්‍රිසම්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
13. ක්‍රිසම් තෛලයෙන් ආලේප කර කිතුනුවකු ලෙස ශක්තිමත් කරන කරුණු දෙක ලියන්න
14. ප්‍රසාද ස්නාපනය තුළ ආලේපිත කිතුනුවාට පැවරෙන ත්‍රිවිධ කාර්ය ලියන්න
15. පාස්කු ඉටි පහනින් සංකේතවත් කරන්නේ මොනවාද?



අභිෂේ්ක ආලේපය

16.ජේසුස් වහන්සේගේ ජීවිතයේ ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය දැක්වෙන අවස්ථා ඇතුළත් බයිබල් පාඨ ලියන්න

a. පිළිසිඳ ගැනීමේ අවස්ථාව - මරිය තුමියට දැනුම් දුන් අවස්ථාව ( ලූක් 1:35)
   - ජුසේ තුමාට දැනුම් දුන් අවස්ථාව ( ලූක් 1:20)

b. ජේසුස් වහන්සේ බව්තීස්ම ලැබූ අවස්ථාව

c. ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළ අවස්ථාව (ලූක් 4:18)

17.ශුද්ධාත්මයාණන් අපෝස්තුලුවරුන් වෙත පැමිණෙන බව ප්‍රකාශ කරන ජේසුස් වහන්සේ ශුද්ධාත්මාගමණයෙන් පසු අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාකාරීත්වය ගැන දක්වන කරුණු 2 ලියන්න ( ක්‍රියා 1:8)

18. අභිෂේ්ක ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් 7 ක් ලියන්න

19. අභිෂේ්ක ආලේපය ලැබීම නිසා අපට ලැබෙන වරප්‍රසාද 5 ක් විස්තර කරන්න

20.අභිෂේ්ක ආලේපය දේව ප්‍රසාද නිධානය දානය කරන ප්‍රථම නිල සේවකයා කවුද?

21.පූජාප්‍රසාදි තුමෙකුට අභිෂේ්ක ආලේපය දානය කිරීමට බලය ඇති අවස්ථා 2 ක් නම් කරන්න

22.කිතුනු දරුවෙකු ලෙස වර්තමාන සමාජයේදී ඔබට එල්ල වන අභියෝග 5 ක් නම් කර ඉන් ජය ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න

මාගේ විශ්වාසයට හා පිරිසිදුකමට

අභියෝග පැමිණෙන විට

ක්‍රිස්තු සේවා භටයෙක් මෙන් සටන් කරමි


මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

සුවෙන් පෙරට
**e ඉගෙනුම් පියස**
**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 13 පාඩම - සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන |
|---|---|---|

1. සුවය දානය කිරීමේ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න
2. අපට ආත්මික හා ශාරීරික සුවය අවශ්‍ය වන්නේ කුමක් සදහාද?



**සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය**

3. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හැදින්වෙන වෙනත් නම් 4 ක් ලියන්න
4. ඇතුළාන්ත සිත් හැරීම පිළිබද කරුණු 3 ක් ලියන්න
5. ඇතුළාන්ත සිත් හැරීමකින් තොර පශ්චාත්තාපී ක්‍රියා පිළිබද ගීතාවලිය පොතේ සදහන් වන්නේ මොනවාද?
6. මනස්ථාපනය වීම යනු කුමක්ද?
7. මනස්ථාපනය පිළිබද ජෝවෙල් දිවැසිවරයා සදහන් කරන්නේ කුමක්ද?(ජොවෙල් 2:13)
8. මනස්ථාපනයේ ආකාර දෙක නම් කරන්න.
9. දයාධික මනස්ථාපය යනු කුමක්ද?
10. භයාධික මනස්ථාපය යනු කුමක්ද?
11. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පියවර පහ ලියන්න
12. මනස්ථාප ක්‍රම හෙවත් පශ්චාත්තාපී ක්‍රියා පහක් නම් කරන්න
13. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය මගින් ලැබෙන වරප්‍රසාද 4 ක් ලියන්න



**රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය**

14. ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ අවස්ථා 2 ක් ලියන්න
15. සළුවට අත ගැසූ ස්ත්‍රියට ජේසුස් වහන්සේ වදාළ වචන ලියන්න
16. ජාකොබ් තුමාගේ ලිපියට අනුව රෝගී අයෙක් සිටී නම් කල යුතු දේවල් 2 ක් ලියන්න
17. රෝගීන්ගේ ආලේපය යනු කුමක්දැයි පැහැදිලි කරන්න
18. "මේ පාරිශුද්ධ ආලෙපයෙන් ද තමන් වහන්සේගේ දයාබර කරුණාවෙන් ද ස්වාමින් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරම් දෙමින් , ඔබට ආධාර කරන සේක්වා.!ආමෙන්. ඔබේ ඔබ මුදා ගැලවීම දානය කරන සේක්වා! ආමෙන් " මෙලෙස උගන්වා ඇත්තේ කොහේද?
19. රෝගීන්ගේ ආලේපය සිදු කරන පිළිවෙත ලියන්න
20. රෝගීන්ගේ ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද නම් කරන්න.

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda


| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 14 පාඩම - පූජකවරය |
|---|---|---|

1. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න
2. සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන අනිකුත් දේව ප්‍රසාද නිධාන වලින් වෙනස් වීමට හේතු තුනක් ලියන්න



## පූජකවරය

3. ක්‍රිස්තුස් වහන්සේ අපොස්තුලුවරුන්ට පවරන ලද ධර්මදූත සේවාව උන්වහන්සේගේ දෙවන ආගමනය දක්වා පවත්වාගෙන යාම සඳහා දී ඇති දේව ප්‍රසාද නිධානය කුමක්ද?
4. නිල පූජකවරයේ ධූරයන් තුන නම් කරන්න
5. පූජකවරයේ පූර්ණත්වය හිමි වන ධූරය කුමක්ද?
6. රාජගුරුප්‍රසාදින් වහන්සේලාගේ වගකීම් තුනක් ලියන්න
7. තේවාචාරී තුමන්ලාගේ වගකීම් 3 ක් ලියන්න
8. පූජාප්‍රසාදි තුමන්ලාගේ වගකීම් 5ක් ලියන්න
9. පූජාප්‍රසාදිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න
10. පදවි පූජක යනු කවුරුන්දැයි හඳුන්වන්න
11. පැවිදි පූජක යනු කවුරුන්දැයි හඳුන්වන්න
12. පදවි පූජක පොරොන්දු දෙක ලියා හඳුන්වන්න
13. පූජාප්‍රසාදී තුමන්ලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම් 7 ක් ලියන්න
14. පූජකවරය දානය කරන්නට ඉලය ඇත්තේ කාටද? පූජකවරය දානය කරන්නේ කෙසේද?
15. පූජකවරය ලැබීමට සම්පූර්ණ විය යුතු සුදුසුකම් 6ක් ලියන්න




මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දේව කැඳවීම් වැඩිකර දෙන ලෙස ඉල්ලා දෙවිඳුන් යදින්න. දේව කැඳවීම් ලබා ඇති අයට දුරුපරීක්ෂා වලින් ජය ගැනීමටත් ඔවුන්ගේ සේවාව සඳහා දේව ආශීර්වාදයත් පතා දෙවිඳුන් යදින්න

සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 15 පාඩම - ආශීර්වාදකාර බන්ධනය |



## ආශීර්වාදකාර බන්ධනය

1. ආශීර්වාදකාර බන්ධනය පිළිබඳව ජේසුස් වහන්සේ වදාළ වචන ලියන්න
2. කිතුනු විවාහයේ ලක්ෂණ 2 ලියන්න
3. ඒකත්වය යනු කුමක්ද?
4. අඛණ්ඩත්වය යනු කුමක්ද?
5. කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියා ඒවා විස්තර කරන්න
6. කතෝලික විවාහයට ඇති නීත්‍යානුකූල බාධා 5ක් ලියන්න
7. කිතුනු විවාහයේ බාහිර සලකුණ කුමක්ද?
8. කිතුනු විවාහයේ පොරොන්දුව ලියන්න
9. ආශීර්වාදකාර බන්ධනය දේව ප්‍රසාද නිධානය දානය කරන්නේ කවුද?
10. ආශීර්වාදකාර බන්ධනය දානය කිරීමේදී සභාවේ නිල සාක්ෂිකරුවා කවුද?
11. විවාහ ගිවිසුම සම්පන්දව එපීස ලිපියේ සදහන් කරුණු 5 ක් ලියන්න
12. ආශීර්වාදකාර බන්ධනය පිළිබද සිවිල් නීතියේ ඇති කරුණු 2 ක් ලියන්න
13. කතෝලික විවිධ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා කළහැක් දේවල් 7 ක් ලියන්න.
14. පවුල තුළ සහයෝගයෙන් ක්‍රියා කළ හැකි අවස්ථා 3 ක් ලියන්න

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය



සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 16 පාඩම - පැවිදි දිවිය |
|---|---|---|

1. ආරණ්‍යවාසී තාපසයන් අතර පළමුවැන්නා කවුද? එතුමා සිටි කාලය දක්වන්න
2. ඊජිප්තුවේ ශු. අන්තෝනි තුමාගේ කාලයේ කාන්තාර ආශ්‍රිතව තාපසයින් කොපමණ සිටින්නට ඇතිද?
3. තාපස ජීවිත ක්‍රමවත් කළ තිදෙනෙකු නම් කරන්න
4. තාපස ජීවිතයට විනය මාලාවක් සකස් කර තාපස ජීවිත වල පුරෝගාමීන් වූ දෙදෙනා කවුද?
5. පැවිදි තත්වය යනු කුමක්ද?
6. පැවිදි දිවියේ වේදභාර තුන නම් කරන්න
7. පැවිදි නිකායන් කොටස් දෙක නම් කරන්න
8. පූජක නොවන පැවිදි අය බෙදෙන කොටස් දෙක නම් කරන්න
9. පැවිදි දිවියේ ලක්ෂණ තුන ලියන්න
10. පැවිදි පූජක නිකායන් තුනක් නම් කරන්න
11. පැවැදි සොහොයුරන්ගේ නිකායන් 4 ක් නම් කරන්න
12. පැවිදි සොයුරියන්ගේ නිකායන් 6 ක් නම් කරන්න
13. පැවිදි ජීවිත තුළින් ලබා ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න
14. පැවිදි අයගේ සේවාවන් 10 ක් නම් කරන්න (පොදුවේ සියලු නිකායන්ගේ සේවාවන් ගන්න)

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

පැවිදි නිකායන්

පැවිදි පූජක

පූජක නොවන පැවිදි අය



පැවිදි සොහොයුරන්



පැවිදි සෙහොයුරියන්



සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | 17 පාඩම - ගිහි ධර්මදූත සේවය |
|---|---|---|

1. පොදු පූජකවරය හා නිල පූජකවරය හඳුන්වන්න
2. ගිහි අපෝස්තලික සේවාව පිළිබඳව ජාතීන්ගේ ආලෝකය 37 වගන්තිය ලියන්න
3. කිතුනු දිවියේ කේන්ද්‍රස්ථානය වන්නේ කුමක්ද?
4. පොදු පූජකවරය තුළ කිතුනුවාට වගකීම් ඉටු කිරීමට හැකි දේවස්ථානය ආශ්‍රිත ගිහි ධර්මදූත සේවා 10 ක් නම් කරන්න
5. පොදු පූජකවරය තුළ කිතුනුවාට පැවරෙන ත්‍රිවිධ කාර්ය නම් කරන්න
6. දිවැසිවර කාර්යයේ දූත සේවාව කුමක්ද?
7. කතෝලික දහම් පාසලේ අරමුණු හා සේවා දෙක බැගින් ලියන්න
8. මරිය හමුදාව ආරම්භ කරන ලද්දේ කවුද?
9. මරිය හමුදාවේ අරමුණු හා සේවා දෙක බැගින් ලියන්න
10. ජේසුස් වහන්සේ අපට දක්වන ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීම සඳහා උන්වහන්සේ විසින්ම ස්ථාපිත කළ ශුද්ධවන්තභාවය අඛණ්ඩව පවත්වා ගන්නා ප්‍රබල ගිහි අපෝස්තලික සේවාව කුමක්ද?
11. දිව්‍ය හෘදය සමිතියේ අරමුණු හා සේවා තුන බැගින් ලියන්න
12. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
    I. සහභාගිවිය යුතු අයගේ වයස් සීමාව:-
    II. ආරම්භ කළ පුද්ගලයා:-
    III. ජාත්‍යන්තර මූලස්ථානය පිහිටි රට:-
    IV. ආසියාතික මූලස්ථානය පිහිටි රට:-
    V. ආදර්ශ පාඨය:-
    VI. අරමුණු :-
    VII. අනු පරමාර්ථ:-
    VIII. ක්‍රමවේදය නැතහොත් ආධ්‍යාත්මිකත්වයඥ-
    IX. නව යොවුන් වියේ ජීවිත ගොඩ නංවන "H" තුන:-

13. සාන්ත විසෙන්තිද පාවුලා සමිතියෙන් සරණය වන කණ්ඩායම් නම් කරන්න
14. සාන්ත විසෙන්තිද පාවුලා සමිතියේ අරම්භකයා කවුද?
15. සාන්ත විසෙන්තිද පාවුලා සමිතියේ අරමුණු හා සේවා දෙක බැගින් ලියන්න
16. නව යොවුන් වියේ දරුවන්ට සාමාජිකත්වය ලබා ගත හැකැ සමිති සමාගම් 5 ක් නම් කරන්න

